# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 අප්‍රේල්/ මැයි

සමාජීය විද්‍යා පීඨය

ජනසන්නිවේදනය (නව/පැරණි නිර්දේශය)

### ජනමාධ්‍ය ඉතිහාසය MACO – E 1025

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. සමාජ විකාශනය හා සන්නිවේදන ඉතිහාසය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි. මානව සන්නිවේදන ඉතිහාසයේ සංධිස්ථාන ඇසුරෙන් සාකච්ඡා කරන්න.

2. පුවත්පත බිහිවීම හා විකාශය කෙරෙහි බලපෑ සාධක ලාංකේය පුවත්පත් මාධ්‍යයට විශේෂිතව සාකච්ඡා කරන්න.

3. හඬ පිළිබඳව කරන ලද විවිධ අත්හදාබැලීම් වල ප්‍රතිඵලයක් ලෙස ගුවන්විදුලි මාධ්‍යයේ ආරම්භය සිදුවිය. විමසන්න.

4. 90 දශකයෙන් පසු ලාංකේය රූපවාහිනී මාධ්‍යයේ ඇතිවූ ව්‍යුහාත්මක වෙනස්කම් හා සමාජ බලපෑම පිළිබඳව නිදර්ශන ඇසුරෙන් සාකච්ඡා කරන්න.

5. 'චලනය' සටහන් කර ගැනීමට මානව ඉතිහාසයේ ආරම්භයේ සිටම විවිධ ප්‍රයත්න දැරීය. සිනමා මාධ්‍යයේ ආරම්භයට බලපෑ පුරෝගාමී අත්හදාබැලීම් පිළිබඳව නිදර්ශන ඇසුරෙන් විමර්ශනයක යෙදෙන්න.

6. ලාංකේය සිනමාව ජාත්‍යන්තරයට ගෙනගිය සිනමාකරුවන් හතර දෙනෙක් (04) නිදර්ශන ලෙස ගනිමින් දේශීය සිනමාව වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වය පිළිබඳ රචනාවක් සපයන්න.

7. ග්‍රාහකයා නව මාධ්‍ය පිළිබඳව වැඩි වශයෙන් විශ්වාස කරයි. සමකාලීන ජනමාධ්‍යයේ මූලික හැඩය වෙනස් වීමට නව මාධ්‍ය බලපෑ ආකාරය පිළිබඳව විමර්ශනයක යෙදෙන්න.

8. තෝරා ගත් මාතෘකා දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

   I. යු ටියුබ් (YouTube)
   II. ප්‍රාදේශීය ගුවන් විදුලිය
   III. අමරසිරි කලංසූරිය
   IV. සාම්ප්‍රදායික මාධ්‍ය
   V. ප්‍රේමකීර්ති ද අල්විස්
   VI. රාවය

***********************************